(අටවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 1.]

# පාර්ලිමේන්තුවේ

# න්‍යාය පුස්තකය

## 2020 ජනවාරි 21 වැනි අඟහරුවාදා ඇතුළුව එදින සිට

## නිකුත් කළේ 2020 ජනවාරි 03 වැනි සිකුරාදා

## 2020 ජනවාරි 21 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1/'20

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෛද්‍යවරුන්ගේ නමින් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කර ඇති වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව පූර්ණ කාලීන හා අර්ධ කාලීන වශයෙන් ලියාපදිංචි කර ඇති ආකාරය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වෛද්‍යවරුන් සතු පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව පිළිබඳ අවසන්වරට සංගණනයක් සිදු කළ දිනය කවරේද;

(ii) නැවත සංගණනයක් සිදු කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ලියාපදිංචි සහතිකයක් නොමැතිව පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑමට එරෙහිව ගත හැකි නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

(ii) පසුගිය වසර දෙක තුළ නීතිය හමුවට පමුණුවන ලද ලියාපදිංචි නොකළ වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

41/'20

ගරු චමින්ද විජේසිරි මහතා,— සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපනය කරන ලද වර්ෂය කවරේද;

(ii) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ ආරම්භක අරමුණු කවරේද;

(iii) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපිත කළ දින සිට අවසන් අධ්‍යක්ෂ මණ්ඩලය දක්වා එහි අධ්‍යක්ෂ මණ්ඩලවල සිටි පුද්ගලයන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් සහ ලැබූ වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ආරම්භයේ සිට ලැබූ අලාභය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ණය ලබාගත් රාජ්‍ය ආයතන ණය ගෙවීමට ඇති රාජ්‍ය ආයතන හා එම ණය ප්‍රමාණයන් කවරේද;

(vi) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ අනාගතය සම්බන්ධයෙන් රජය ගැනීමට බලාපොරොත්තුවන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

69/'20

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිරිවෙන් අධ්‍යාපන ආයතන සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේදී සලකා බලනු ලබන මූලික අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) දැනට පිරිවෙන් අධ්‍යාපන ආයතනවල ගුරු හිඟයක් පවතින්නේද;

(iii) එසේ නම්, ගුරුවරුන්ගේ හිඟය කොපමණද;

(iv) අධ්‍යාපන අමාත්‍යාංශයේ, පිරිවෙන් අධ්‍යාපන ඒකකය මඟින් පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2/'20

ගරු බුද්ධික පතිරණ මහතා,— ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ ක්‍රීඩාගාර අබලන් තත්ත්වයේ පවතින බවත්;

(ii) නිසි නඩත්තුවක් නොමැති වීම හේතුවෙන් ඉදිරියේදී ජාත්‍යන්තර තරඟ පැවැත්වීමට නොහැකි තත්ත්වයක් උද්ගත විය හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ 2016, 2017 හා 2018 යන වර්ෂයන්හිදී පැවැත්වූ ජාත්‍යන්තර ක්‍රිකට් තරඟ සංඛ්‍යාව;

(ii) එම තරඟවලින් ලැබුණු ආදායම;

(iii) උක්ත වර්ෂ තුළ ක්‍රීඩාංගණයේ කටයුතු සඳහා වෙන් කළ මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

42/’20

ගරු චමින්ද විජේසිරි මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත තුළ පිහිටි දේශීය කිරිපිටි කර්මාන්ත ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්ත ශාලාවල නම් හා ලිපිනයන් කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම කර්මාන්ත ශාලාවල නිෂ්පාදන ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) වර්තමානයේදී ඌව පළාත් දේශීය කිරිපිටි කර්මාන්ත ශාලා මුහුණ දී ඇති ගැටලු විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

70/’20

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වනවිට ලියාපදිංචි කර ඇති දහම් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) දහම් පාසල් ගුරුවරුන්ට රජය විසින් ලබාදෙන ප්‍රතිලාභ කවරේද;

(iii) දහම් අධ්‍යාපනය නංවාලීම සඳහා මෙම ස්වේච්ඡා දහම් පාසල් ගුරුවරුන් වෙනුවෙන් ඉදිරියට සැලසුම් කර ඇති වැඩසටහන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2020 ජනවාරි 22 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

3/’20

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කටාර් රාජ්‍යයේ නාගරික හා පාරිසරික අමාත්‍යාංශය (MME) විසින් එම රජයේ සේවය කරන සියලු ඉංජිනේරු වෘත්තීයවේදීන් එම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි විය යුතු බවට නව රෙගුලාසි පනවා ඇති බවත්;

(ii) ලියාපදිංචි නොවන වෘත්තීයවේදීන් වසර තුනක සිර දඬුවමකට හෝ රියාල් 100,000 දඩයකට හෝ යටත් වන බවත්;

(iii) ශ්‍රී ලංකාව ද මෙම MME අනුමතිය අධ්‍යාපන ආයතන කිහිපයකට පමණක් ලබාගෙන ඇති බවත්;

(iv) ශ්‍රී ලංකාව තුළ මෙම MME ලැයිස්තුවට ඇතුළත් කළ හැකි ආයතන තවත් ඇති බවත්;

(v) ඉන්දියාව, පිලිපීනය වැනි රටවල්වල අඩු ගුණාත්මක බවක් ඇති ආයතනද මෙම ලැයිස්තුවට ඇතුළත් කිරීම හේතුවෙන් අප රටේ වෘත්තීයවේදීන්ගේ රැකියා අවස්ථා අවදානමකට ලක්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) MME ලැයිස්තුව යාවත්කාලීන කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එයට ඇතුළත් කරන ලද නව ආයතන කවරේද;

(iii) උක්ත අනුමතිය නොමැතිවීම හේතුවෙන් රැකියා අහිමි වී ඇති ශ්‍රී ලාංකික වෘත්තීයවේදීන් වෙනුවෙන් රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

43/'20

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්වලට සහභාගී වූ, පළාත් පාලන නියෝජිතයන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නියෝජිතයන්ගේ නම් හා අදාළ පළාත් පාලන ආයතන කවරේද;

(iii) එම වැඩමුළු පැවති රටවල්, නගර හා කාලසීමා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම එක් එක් වැඩමුළුවලට සහභාගී වීම සඳහා වැය කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම වැඩමුළුවලින් පසුව කසළ කළමනාකරණය සඳහා වැඩසටහන් දියත් කළ පළාත් පාලන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

71/'20

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ සෑම ග්‍රාම නිලධාරි වසමක් සඳහාම ''සේවා පියස'' කාර්යාලයක් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) ''සේවා පියස'' එක් කාර්යාලයක් ඉදිකිරීමට ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මෙම වැඩසටහන අවසන් කිරීමට සැලසුම් කර ඇති දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

4/'20

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, දිගන, මහබෙරියතැන්න ප්‍රදේශයේ ගුවන් තොටුපොළක් ඉදිකිරීමට පසුගිය රජය සමයේ කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කිරීමට සැලසුම් කර තිබූ මුළු මුදල කොපමණද;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා පවරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය අක්කර කොපමණද;

(iv) මේ වනවිට ඉදිකිරීම් කටයුතු සඳහා සහ ඉඩම් පවරා ගැනීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) වැඩ අවසන් කිරීමට සැලසුම් කර ඇති දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

44/'20

ගරු චමින්ද විජේසිරි මහතා,— පරිසර සහ වනජීවි සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැළිකසළ සම්බන්ධව තීරණ ගන්නා, ඒ සම්බන්ධව කටයුතු කරන පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන කවරේද;

(ii) 2010 වසරේ සිට මේ දක්වා එම ආයතනවල නිලධාරීන් කැළිකසළ සම්බන්ධව විදේශ අධ්‍යයන චාරිකාවල නිරත වී තිබේද;

(iii) එසේ නම්, එම නිලධාරීන්ගේ නම්, තනතුරු හා විදේශ අධ්‍යයනවල විස්තර කවරේද;

(iv) එම එක් එක් අධ්‍යයන කටයුතු සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එකී අධ්‍යයන චාරිකාවලට සහභාගී වූ නිලධාරීන්ගේ දැනුම අමාත්‍යාංශයේ කටයුතුවලට යොදාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

72/'20

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ පවතින රැකියා වියුක්ති අනුපාතය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රැකියා වියුක්ති ගැටලුව සඳහා ලබාදෙන විසඳුම් කවරේද;

(iii) එම විසඳුම් මඟින් සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්කයන් කවරේද;

(iv) එම ඉලක්කයන් සපුරා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 ජනවාරි 23 වැනි බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

5/'20

ගරු බුද්ධික පතිරණ මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර නගර සභා බලප්‍රදේශය තුළ ඇති වැලිකන්ද ග්‍රාමය නාය යෑමේ දැඩි අවදානම් ප්‍රදේශයක් ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් නම් කර ඇති බවත්;

(ii) වැලිකන්ද ග්‍රාමයේ වැසියන්ට මහනුවර, හන්තාන, ගලහ වත්තේ ඉඩම් හා නිවාස ඉදිකිරීමට ණය මුදල් ද ලබා දී ඇති බවත්;

(iii) මෙම ප්‍රදේශයේ විශාල යන්ත්‍රෝපකරණ යොදාගෙන පැරණි පඩිපෙළ වෙනුවට පාරක් කපන බවත්;

(iv) මෙම පස් කැපීමට නිසි අවසරයක් ලබාගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගය කැපීම නතර කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

(iii) මෙම නීති විරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ පුද්ගලයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

45/'20

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල - බණ්ඩාරවෙල මාර්ගයේ, 2 වැනි සැතපුම් කණුව අසල පාලම දැඩි ලෙස අබලන් වී ඇති බව දන්නේද;

(ii) මෙම පාලම හරහා ප්‍රවේශ විය යුතු ගම්මානවල නම් කවරේද;

(iii) මෙම පාලමේ ඇති පෞරාණික බව ආරක්ෂා වන පරිදි නවීකරණය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

73/'20

ගරු හේෂා විතානගේ මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බළංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලේබොඩ, උඩකන්ද නමින් කුඹුරු යායක් තිබෙන බව දන්නේද;

(ii) මෙම කුඹුරු යායේ ඇති කුඹුරු ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) දැනට වසර දහයක පමණ කාලයක සිට මෙම කුඹුරු යායට ජලය නොමැති වීම හේතුවෙන් පුරන් වී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, කුඹුරු යාය අස්වැද්දීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

6/'20

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමාජ අසමානතාවය හා සම්පත් බෙදී යාම සාධාරණව සිදු නොවීම හේතුවෙන් ශ්‍රී ලංකාවෙන් දරිද්‍රතාවය තුරන් කිරීමට අපහසු වී ඇති බවත්;

(ii) දැනට ක්‍රියාත්මක විෂයානුබද්ධ අධ්‍යාපන ක්‍රමය තුළින් කුසලතා වර්ධනය නොවීමෙන් කාලීන සමාජයට ගැලපෙන වෘත්තිකයන් බිහි නොවන බවත්;

(iii) නෛතික යන්ත්‍රණයේද යුක්තිය පසිඳලීමේ ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රමවත්ව සිදු නොවන බවත්;

(iv) උක්ත සියලු කරුණු රටේ තරුණ ප්‍රජාවට සෘජුවම බලපාන බවත්;

(v) තරුණයන් සමාජ විරෝධී කටයුතු කෙරෙහි යොමු වීමට මෙම අසහනකාරී මානසිකත්වය බලපාන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පාසල් අධ්‍යාපනය අතරමග නවතන තරුණ ප්‍රජාව වෘත්තීය පුහුණු හෝ වෙනත් විධිමත් ජීවනෝපාය මාර්ග වෙත යොමු කිරීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) පාසල් අධ්‍යාපනය රැකියා වෙළෙඳපොළට ගැළපෙන ලෙස සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කර තිබේද;

(iv) එසේ නම්, එම යෝජනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

46/'20

ගරු චමින්ද විජේසිරි මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති මධ්‍යම රජයට හා පළාත් සභාවට අයත් වාරිමාර්ග ක්‍රම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මධ්‍යම රජයට අයත් වාරිමාර්ග ක්‍රම මගින් අස්වද්දන කුඹුරු ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පළාත් සභාවට අයත් වාරිමාර්ග ක්‍රම මගින් අස්වද්දන කුඹුරු ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2010 වර්ෂයේ සිට මේ දක්වා මධ්‍යම රජය හා පළාත් සභාව, බදුල්ල දිස්ත්‍රික්කයේ වාරිමාර්ග නඩත්තුවට හා ප්‍රතිසංස්කරණයට වැය කළ මුදල් ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

74/'20

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ලියන්ගහවෙල, 7 කනුව, කඩ වීදිය නමින් ඉපැරණි ස්ථානයක් තිබෙන බවත්;

(ii) මෙම ස්ථානය පසුගිය වසර කිහිපය තුළ ප්‍රාදේශීය සභාව විසින් නිසි ලෙස නඩත්තු කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ප්‍රාදේශීය සභාව හරහා මෙම ස්ථානය සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2020 ජනවාරි 24 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

7/'20

ගරු බුද්ධික පතිරණ මහතා,— තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රට තුළ වාර්ගික සමඟිය සහ සහජීවනය ඇති කිරීමට ටෙලිනාට්‍ය, චිත්‍රපට, ගීත ආදී කලා මාධ්‍ය යොදා ගත හැකි බවත්;

(ii) අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් මේ සඳහා යොමු කිරීමට වැඩපිළිවෙළක් සකස් කිරීම තුළින් සුභාවිත නිර්මාණ බිහි කළ හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) සහජීවනය පාදක කර ගත් කලා නිර්මාණ සිදු කිරීම සඳහා රජය පියවර ගෙන තිබේද;

(ii) එසේනම්, එම පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

47/'20

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරවෙල මහ නගර සභාව සතු වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් වාහනයේ අංකය කවරේද;

(iii) එම එක් එක් වාහනය ලබාදී ඇති නිලධාරින් හා අංශ කවරේද;

(iv) නගර සභාව සතු වාහන වෙනත් බාහිර ආයතන වෙත ලබාදී ඇත්නම්, එසේ ලබාදී ඇති නිලධාරින්ගේ හා ආයතනවල නම් කවරේද;

(v) බණ්ඩාරවෙල මහ නගර සභාව සතු වාහන වෙනත් පාර්ශ්ව වෙත ලබාදීමේදී යම් අක්‍රමිකතාවක් සිදුවී ඇත්නම්, ඒ සම්බන්ධව අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

75/'20

ගරු හේෂා විතානගේ මහතා,— ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ධාවනයෙන් ඉවත් කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ ඉවත් කරන ලද මැදිරි අතරින් අලුත්වැඩියා කර නැවත ධාවනයට එක් කරන ලද මැදිරි සංඛ්‍යාව කොපමණද;

(iii) එම මැදිරි අලුත්වැඩියා කරන ලද ආයතනයේ නම කවරේද;

(iv) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) ධාවනයෙන් ඉවත් කරන ලද සෙසු දුම්රිය මැදිරි යළි ධාවනයට එක් කිරීම සඳහා අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

8/'20

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්වවිද්‍යාල සිසුන්ට හා ආචාර්යවරුන්ට Tab පරිගණක ලබා දීමට රජය සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) මේ සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතන කවරේද;

(v) ඒ අතරින් තෝරාගත් ආයතනයේ නම කවරේද;

(vi) ටෙන්ඩර් කැඳවීමේ දී ඉදිරිපත් කරන ලද පිරිවිතර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අ (i) හි සඳහන් පිරිසට Tab පරිගණක ලබා දීම සඳහා මිල දී ගැනීම් සිදු කර තිබේද;

(ii) එසේ නම්, ලංකාවේ සියලුම විශ්වවිද්‍යාල සිසුන්ට සහ ආචාර්යවරුන්ට Tab පරිගණක ලබා දීමට බලාපොරොත්තු වන දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

48/’20

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති පිරිවෙන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරිවෙන්වල නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් පිරිවෙනෙහි ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව සහ සේවය කරන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ පිරිවෙන් අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

76/’20

ගරු හේෂා විතානගේ මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොඩ ඉඩම් නොමැති පුද්ගලයන්ට තම කුඹුරු ඉඩමෙන් පර්චස් 10ක කොටසක් ගොඩකර නිවසක් ඉදිකර ගැනීමට අවසර ලබාදීම දීර්ඝ කාලයක සිට පැවති බව දන්නේද;

(ii) දැනට ගොඩ ඉඩම් අහිමි පුද්ගලයන්ට තම කුඹුරු ඉඩමෙන් පර්චස් 10 ක පමණ කොටසක් ගොඩකර නිවසක් ඉදිකිරීම සඳහා ලබා දී තිබූ අවස්ථා අහිමි කර ඇති බව පිළිගන්නේද;

(iii) එම නිසා දිවයිනේ විවිධ ප්‍රදේශවල ඉඩම් නොමැති විශාල පිරිසක් අසරණ තත්ත්වයකට පත්ව සිටින බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුඹුරු ඉඩමෙන් පර්චස් 10ක ප්‍රමාණයක් ගොඩකර ගැනීම සඳහා මේ වනවිට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයදුම් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම පුද්ගලයන්ට ඉතා කඩිනමින් එම පර්චස් 10ක කුඹුරු ඉඩම් ගොඩකර ගැනීමට අවස්ථා සලසා දෙන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2020 පෙබරවාරි 07 වැනි සිකුරාදා

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

1.

පා. 1/'20

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳව විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳව අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳව ගවේෂණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

2.

පා .2/'20

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට අවශ්‍ය සීනි රට තුළ නිපදවීම,— ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සීනි නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් ශ්‍රී ලංකාව සතුව ඇති බැවින්, මනා කළමනාකාරීත්වයකින්, කාර්යක්ෂමව හා සැලසුම් සහිතව කටයුතු කර රටට අවශ්‍ය සීනි ප්‍රමාණය මෙරට නිෂ්පාදනය කිරීමට හා සීනි පිරිපහදු කිරීමට අවශ්‍ය කර්මාන්තශාලා රජය මඟින් ස්ථාපනය කර සීනි කර්මාන්තය රැක ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

3.

පා. 3/'20

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන් හා පාසල් වෑන් රථ රියැදුරන් යන පිරිස් සඳහා දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේදයන් තුළින් සරළව පැහැදිලි කර, රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම සඳහා දරුවා සමාජ අභියෝගයන් හමුවේ ආරක්ෂා කරන්නේ කෙසේද යන්න පිළිබඳව සංවාදයක් පැවැත්වීමට ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

4.

පා. 4/'20

ගරු බුද්ධික පතිරණ මහතා,— බුද්ධිමය දිළිඳු බව තුරන් කිරීම,— භෞතික වෙළෙඳ භාණ්ඩ සැරිසරන වේගයට සාපේක්ෂව දැනුම, බුද්ධිය හා මානව හර පද්ධතීන් ජනතාව වෙත ළඟා නොවීම හේතුවෙන් නොදැනුවත්කම හිස එසවීම තුළින් බුද්ධිමය දිළිඳුභාවය අද අප රට තුළ දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවක් වුවද, ඒ පිළිබඳව රට තුළ ඇත්තේ අඩු අවධානයක් බැවින්, රටේ ජනතාවගේ බුද්ධිමය දිළිඳු බව නැති කිරීමට සියලු වයස් කාණ්ඩයන් ආවරණය වන පරිදි විධිමත්ව සැලසුම් කරන ලද ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

5.

පා. 7/'19

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු අධ්‍යයන කේන්ද්‍රයක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාවේ හා ලෝකයේ විවිධ රටවල පාර්ලිමේන්තු ක්‍රියාදාමයන්, පාර්ලිමේන්තු ඉතිහාසය හා දේශපාලන ක්‍රමවේද පිළිබඳ පාසල් සිසුන්ට, තරුණ තරුණියන්ට හා අනෙකුත් විද්‍යාර්ථයන්ට අධ්‍යයනය කිරීම සඳහා පහසුකම් සැලසිය හැකි පාර්ලිමේන්තු අධ්‍යයන කේන්ද්‍රයක් පාර්ලිමේන්තුව තුළ ස්ථාපනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

6.

පා. 8/'20

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ දරුවන්ගේ සෞඛ්‍යයට ජනමාධ්‍ය හරහා සිදුවන බලපෑම අවම කිරීම,— අධික ලෙස ග්ලූකෝස්, මේදය හා ලුණු අඩංගු ආහාර වර්ග ගැනීමෙන් මෙරට ළමුන් අතර තරබාරුව, හෘදරෝග, අධිරුධිර පීඩනය ආදී බෝ නොවන රෝග ව්‍යාප්ත වෙමින් පවතින අතර මෙවැනි අහිතකර ආහාර වර්ග සඳහා ළමුන් පෙළඹවීමට ජනමාධ්‍ය හරහා ළමුන් ඉලක්ක කරගෙන සිදු කරනු ලබන වෙළෙඳ ප්‍රචාරණයන් ප්‍රධාන වශයෙන් හේතුවන බැවින් ළමා ආහාර සම්බන්ධයෙන් සිදු කරනු ලබන වෙළෙඳ ප්‍රචාරණයන් නියාමනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

7.

පා. 9/'20

ගරු බුද්ධික පතිරණ මහතා,— සංකීර්ණ ගෝලීය වෙළෙඳපොළ නිසා ජනතාවට ඇතිවන ගැටලු අවම කිරීම,— ගෝලීයකරණය විසින් හඳුන්වාදුන් ලෝක වෙළෙඳ රටාව මිනිසාගේ මනස ආක්‍රමණය කිරීම හේතුකොට ගෙන ඔහු පාරම්පරිකව ගෙන ආ හර පද්ධතීන් හා දියුණු දාර්ශනික චින්තනයන් මිනිස් මනස තුළින් උදුරා දැමීම වර්තමානය වනවිට ශ්‍රී ලාංකිකයින්ට ද පොදු බැවින්, වෙළෙඳපොළ ආර්ථිකය තුළ ගොඩනැගෙන සංකීර්ණ ජීවන රටාව හා ඒ සමඟ පැන නගින සංකීර්ණ සමාජීය ප්‍රශ්නත් විසඳා ගනිමින් සහනශීලී දිවි පැවැත්මකට යා යුතු වන්නේ කෙසේද යන්න පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් හා බුද්ධිමය සංවාදයක් රට තුළ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

8.

පා. 10/'20

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසරය සුරැකීමෙන් නිරෝගී රටක් ගොඩනැගීම,— වර්තමාන ශ්‍රී ලංකාවේ පරිසර දූෂණය ඉහළ යාම හේතුවෙන් ජලයේ හා ආහාරවල විකිරණශීලී බව වැඩි වී ඇති අතර අනාගතයේදී මිනිසාට වැළඳෙන ඇතැම් රෝගවල රෝග නිධානය පවා සොයා ගැනීම අපහසු විය හැකි බැවින්, මේ පිළිබඳ වැඩිදුර විමර්ශනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කර වාර්තාවක් කැඳවා, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් රටේ ජනතාවගේ නීරෝගීභාවය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

9.

පා. 11/'20

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ ආරක්ෂාවට කෘෂිකර්මය සුරක්ෂිත කිරීම,— ධනවාදයේ තුන්වැනි කාර්තුව වන දෙවැනි ලෝක යුද්ධයෙන් පසු කාලයේදී හරිත විප්ලවයත් සමඟ කෘෂිකාර්මික ජීවන රටාව සම්පූර්ණයෙන්ම වෙනස් වීම හේතුවෙන් වර්තමාන ලෝක ප්‍රජාව මුහුණ දී ඇති පරිසර දූෂණය, නීරෝගී බව නැතිවීම, පිරිසිදු ආහාර නොමැතිවීම ආදී අවදානම් තත්ත්වයන්ගෙන් ශ්‍රී ලංකාව ආරක්ෂා කර ගැනීම සඳහා ජනතාව තිරසාර කෘෂිකර්ම භාවිතයන්ට පෙළඹවීමෙන් හා ගොවීන් ආරක්ෂා කෙරෙන රාජ්‍ය ප්‍රතිපත්ති රට තුළ ස්ථාපිත කරවීමෙන් රටේ අනාගතය සුරක්ෂිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

10.

පා. 12/’20

ගරු බුද්ධික පතිරණ මහතා,— මාතෘ හා ළමා මන්දපෝෂණය තුරන් කිරීම,— ශ්‍රී ලංකාව තුළ අඩුබර දරු උපත් අනුපාතිකය 25% තරම් ඉහළ අගයක් ගන්නා අතර එයට ප්‍රධාන සාධකය වන්නේ පෝෂ්‍යදායී ආහාර හිඟකම වන බැවින්, මාතෘ හා ළමා මන්දපෝෂණය දුරලීමට අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර දුප්පත් ජනතාවට ලබා දීම ප්‍රමුඛතාවය කරගත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

11.

පා. 13/’20

ගරු චමින්ද විජේසිරි මහතා,— ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල් ඉතා අඩු ආර්ථික මට්ටමක පවතින බැවින්, එවැනි පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

12.

පා. 14/’20

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට යාන්ත්‍රණයක් සකස් කිරීම,— රටක සංවර්ධනය සඳහා තොරතුරු වැදගත් සාධකයක් වන අතර, එම තොරතුරු සම්පාදනයේදී වැදගත් මෙහෙවරක් ඉටුකරන ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට යාන්ත්‍රණයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

13.

පා. 15/’20

ගරු හේෂා විතානගේ මහතා,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් බණ්ඩාරවෙල, ලියන්ගහවෙල ප්‍රදේශයේ නිවාස, ඉඩම් ඇතුළු දේපළ අහිමි වූ පවුල් සඳහා සහන සලසාදීම,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා භූගත උමං මාර්ග කැණීම හේතුවෙන් බණ්ඩාරවෙල, ලියන්ගහවෙල ප්‍රදේශයේ ජනතාවට සිය නිවාස, ඉඩම් ඇතුළු දේපළ අහිමි වී මේ වනවිට වසර තුනක කාලයක් ගතවී තිබුණ ද, අවතැන් වූ එම ජනතාවට මෙතෙක් කිසිදු වන්දි මුදලක් හෝ සහනයක් ලැබී නොමැති බැවින්, එම ජනතාවට සහන සලසා දීමේ වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

14.

පා. 16/’20

ගරු හේෂා විතානගේ මහතා,— දුම්රිය මඟින් එළවළු ප්‍රවාහනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම,— බදුල්ල දිස්ත්‍රික්කය ඇතුළු එළවළු නිෂ්පාදනය කරන දිස්ත්‍රික්කවල සිට එළවළු ගොවීන්ගේ නිෂ්පාදන අඩු පිරිවැයකින්, අපතේ යෑම අවම කරමින් දුම්රිය මඟින් රටේ සෙසු ප්‍රදේශවල වෙළෙඳපොළ වෙත ප්‍රවාහනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

15.

පා. 17/'20

ගරු හේෂා විතානගේ මහතා,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ජල හිඟයකට මුහුණ දී සිටින ජනතාවට ජල පහසුකම් ලබාදීම,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් මේ වනවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07ක පවුල් 8394ක ජනතාවට උග්‍ර ජල හිඟයකට මුහුණ පෑමට සිදුවී ඇති බැවින්, එම ජනතාවට අවශ්‍ය ජල පහසුකම් ලබාදීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

16.

පා. 18/'20

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම,— අයහපත් කාලගුණය සහිත කාලසීමාවන්වහිදී නිරන්තරයෙන්ම ගංවතුරින් ආපදාවට ලක්වන රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීමට වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

17.

පා. 19 /'20

ගරු හේෂා විතානගේ මහතා,— අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කිරීම,— කලාව, ක්‍රීඩාව ආදී බොහෝ අංශවල සබරගමුවට උරුම ආවේණික ලක්ෂණ ඇති අතර අද වනවිට වාණිජකරණය හමුවේ එම ආවේණික ලක්ෂණ අභාවයට යාමේ අවදානමක් ඇති බැවින් අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කර ගැනීමේ වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

18.

පා. 20/'20

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ආපදා අවම කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් නිකුත් කරන ලද වාර්තාවන්ට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ආපදා තත්ත්වයන්ට ලක්වීමේ අවදානමක් සහිත ස්ථාන රාශියක් ඇති බව පෙන්වා දී ඇති බැවින්, එම තත්ත්වයන් අවම කිරීම සඳහා යම් වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.